රුහුණ විශ්වවිද්‍යාලය

**2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

**SLS 22563/22663 – ජන සාහිත්‍ය අධ්‍යයනය**

ප්‍රශ්න <u>පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

1. ජන සාහිත්‍යය හා විදග්ධ සාහිත්‍යය අතර ඇති සහසම්බන්ධතාව කෙබඳුදැයි පිරික්සන්න.

2. "ජනකතාව පහළ වන්නේ විශ්‍රාමයෙහි ප්‍රතිඵලයක් ලෙසය." යන ලූ ෂුන් (Lu xun) මතය විමසුමට ලක් කරන්න.

3. "ලොව පුරා ව්‍යාප්ත වී ඇත්තේ එකම භූමියක බිහි වූ ජනකතා සමුදායකි." මේ අදහස සනිදර්ශනව සනාථ කළ හැකිදැයි පරීක්ෂා කරන්න.

4. ආකූල බවේ සිට නිරාකූල බුද්ධි ප්‍රබෝධය ඇති කිරීමෙහි රීති විශේෂයක් වශයෙන් තේරවිලි කවිය වැදගත් වන්නේ කෙසේදැයි නිදර්ශන දක්වමින් පැහැදිලි කරන්න.

5. "පුරාණ ජන සමාජය තුළ පැවති චාරිත්‍ර වාරිත්‍ර ජනකවිය තුළින් විද්‍යාමාන වේ." උක්ත කියමන නිදසුන් ඇසුරින් විග්‍රහ කරන්න.

6. සොකරි ගැමි නාටකය පත්තිනි දෙවියන් අරමුණු කොට සිදු කෙරෙන යාතුකර්මයක් ලෙසට සැලකිය හැක්කේ කවර හේතු මතදැයි විමසන්න.

7. නාඩගම් කලාවේ පරිහානිය කෙරෙහි බලපෑ සාධක කවරේදැයි සාකච්ඡා කරන්න.

8. සෞන්දර්යාත්මක චින්තනය ආගමික දර්ශනය සමග ඒකාත්මික වූ ආකාරය 'ජනකලා' ඇසුරින් සනිදර්ශනව අගයන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 12 බැගිනි)

********************************



123